කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## 2025 අප්‍රේල් මස 26 දින සඳහා කාලගුණ අනාවැකිය
## 2025 අප්‍රේල් මස 26 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

**අන්තර් නිවර්තන අභිසාරී කලාපය (උතුරු අර්ධ ගෝලයේ සහ දකුණු අර්ධ ගෝලයේ සිට පැමිණෙන සුළං අභිසාරී වන කලාපය) දිවයිනේ කාලගුණයට බලපෑම් කරමින් පවතී.**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

බස්නාහිර පළාතේත් පුත්තලම, මන්නාරම, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වෙරළබඩ ප්‍රදේශවල උදෑසන කාලයේදී වැසි වාර කිහිපයක් ඇති විය හැක.

මධ්‍යම, ඌව සහ නැගෙනහිර පළාත්වලත් වවුනියාව සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවල **මි.මී. 75 ක පමණ තරමක තද වැසි** ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

මධ්‍යම සහ ඌව පළාත්වලත් අම්පාර දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

## WEATHER FORECAST FOR 26 APRIL 2025
## Issued at 05.30 a.m. on 26 April 2025

**The Intertropical Convergence Zone (where winds from the Northern Hemisphere and Southern Hemisphere converge) affects the island's weather.**

Showers or thundershowers will occur at most places of the island during the afternoon or night.
Several spells of showers may occur in coastal areas of the Western province and in Puttalam, Mannar, Galle and Matara districts in the morning.

**Fairly heavy falls about 75 mm** are likely at some places in Central, Uva and Eastern provinces and in Vavuniya and Polonnaruwa districts.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Misty conditions can be expected at some places in Central and Uva provinces and in Ampara district during the morning.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

## ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
## 2025 අප්‍රේල් මස 26 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

**වැසි තත්ත්වය:**

මන්නාරම සිට පුත්තලම කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

සුළං නිරිත දෙසින් හමා එන අතර සුළං වේගය පැ.කි.මී. **(25-35)** පමණ වේ. හලාවත සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. 45** පමණ දක්වා ඉහළ යා හැක.

**මුහුදේ ස්වභාවය:**

හලාවත සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක. දිවයින වටාවන සෙසු මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
## Issued at 05.30 a.m. on 26 April 2025

**Condition of Rain:**

Showers or thundershowers will occur in the sea areas off the coast extending from Mannar to Matara via Puttalam, Colombo and Galle. Showers or thundershowers may occur at several places in the other sea areas around the island during the evening or night.

**Winds:**

Winds will be South-westerly and wind speed will be **(25-35) kmph**. Wind speed can increase up to **45 kmph** at times in the sea areas off the coast extending from Chilaw to Kankasanthurai via Mannar and from Matara to Pottuvil via Hambantota.

**State of Sea:**

The sea areas off the coasts extending from Chilaw to Kankasanthurai via Mannar and from Matara to Pottuvil via Hambanthota can be fairly rough at times. The other sea areas around the island can be slight to moderate.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි